# මාසික

# විවරණිකාව

2011 ජුනි



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 06 වැනි කලාපය

**2011 ජුනි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශයඃ ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|


| | | |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 ජූනි | ..... | 06 |
| 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 ජූනි | ..... | 06 |
| 2. වසර 3 සහ වසර 4 පරිණත කාලයකින් යුත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම | ..... | 07 |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමු කළමනාකරුවන් පත්කිරීම | ..... | 08 |
| 4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චීනයේ ව්‍යවහාර මුදල් ඒකකය වන "රෙන්මින්බි" ශ්‍රී ලංකාවේ පිළිගත් විදේශ මුදල් ඒකකයක් ලෙස නම් කිරීම | ..... | 08 |
| 5. 2011 මැයි මස උද්ධමනය | ..... | 09 |
| 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010 සහ 2011 | ..... | 10 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2011 ජුනි

**ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය**

බලශක්ති අංශයේ ස්ථිරසාර සංවර්ධන වැඩපිළිවෙළට සහය සැලසීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 ජුනි මස 20 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. ඊට අදාළ තොරතුරු පහත පරිදි වේ.

1. **එ.ජ.ඩොලර් මිලියන 110 ක් සඳහා වූ ණය මුදල (ආසන්න වශයෙන් රුපියල් බිලියන 12.05)**

   මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය මත සියයට 0.6 ක වාර්ෂික පොලී අනුපාතිකයක් අදාළ වන අතර ඉන් සියයට 0.3 ක් ආපසු ගෙවනු ලැබේ. තවද ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 5 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

2. **ජපන් යෙන් බිලියන 1.44 ක් සඳහා වූ ණය මුදල (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.10)**

   මෙම ණය මුදල සඳහා සහන කාලය තුළ වාර්ෂිකව සියයට 1.0 ක පොලී අනුපාතිකයක් සහ ඉන්පසුව වාර්ෂිකව සියයට 1.5 ක පොලී අනුපාතිකයක් ද අදාළ වේ. වසර 8 ක සහන කාලයකට යටත්ව වසර 32 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලද ණය**

මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් දෙවන වරට අතිරේක මූල්‍ය පහසුකම් සැලසීම සඳහා 2011 අප්‍රේල් 29 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අතර වි.ගැ.හි. මිලියන 63.6 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 11.32 ක) ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද ශේෂය මත සියයට 0.75 ක සේවා ගාස්තුවක් ද, ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

**ස්වීඩනයේ නෝඩියා බැංකුවෙන් ලද ණය**

විදුලිබල ව්‍යාපෘතියේ සිව්වන අදියරෙහි පුළුල් කිරීමේ කටයුතු මූල්‍යනය කිරීම සඳහා 2011 ජුනි මස 17 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ස්වීඩනයේ නෝඩියා බැංකුව අතර එ.ජ.ඩොලර් මිලියන 54.16 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 5.93 ක) ණය මුදල සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය මත සියයට 1.25 ක පොලී අනුපාතයක් ද, වාර්ෂිකව සියයට 0.25 ක අනිවාර්ය ගෙවීමක් ද, ණය මුදල මත සියයට 0.25 ක සැකසුම් ගාස්තුවක් ද අදාළ වේ. මෙම ණය මුදල කොටස් දෙකකින් මුදාහැරීමට නියමිත අතර එම කොටස් දෙකම මාස 6 ක සහන කාලයකට යටත්ව වසර 9 ක් සහ මාස 6 ක් තුළ දී ගෙවා නිම කළ යුතුය.

# 2 වන කොටස
# පුවත්පත් නිවේදන
# 2011 ජුනි

## 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 ජුනි

*පසුගිය වසරේ දී දක්නට ලැබුණු හිතකර වර්ධනයන්, 2011 වසර තුළ ද විශේෂයෙන්ම, ආර්ථිකයේ කර්මාන්ත සහ සේවා අංශවල අඛණ්ඩව පැවතුණි. කෘෂිකාර්මික අංශය තුළ ගංවතුර තත්ත්වය, මහ කන්නයේ අස්වැන්න සඳහා අහිතකර ලෙස බලපෑ නමුත්, 2011 වසරේ දී යල කන්නයේ වී අස්වැන්නේ අපේක්ෂිත වැඩිවීම, වසර පුරා සහල් මිල ගණන් ස්ථායීව පවත්වාගෙනයාමට උපකාරී වනු ඇත. ගංවතුර තත්ත්වයෙන් පසුව, එළවළු සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල අඛණ්ඩ සැපයුමක්* පැවතීම හේතුවෙන් දේශීය ආහාර මිල ගණන් අඩුවීම සිදුවෙමින් පවතින අතර එයින් උද්ධමනකාරී පීඩනයන් සමනය විය.

ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ධාන්‍ය වර්ග සහ සීනි මිල ගණන් මෙම වසර මුල පැවති එහි ඉහළම අගයේ සිට සුළු වශයෙන් පහත වැටුණු අතර, අනෙකුත් බොහෝ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් නොවෙනස්ව පැවතුණි. බොර තෙල් බැරලයක මිල සාමාන්‍ය වශයෙන් එ.ජ.ඩොලර් 112 ක පමණ මට්ටමේ පැවතුණි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පදනම් වර්ෂ = 2002) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මත ගණනය කරනු ලබන උද්ධමනය අපේක්ෂිත ලෙස පෙර මාසයේ දී පැවැති සියයට 9.8 සිට 2011 මැයි මාසයේ දී සියයට 8.8 දක්වා අඩු විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය මැයි මාසයේ දී සියයට 0.3 ක් වැනි සුළු අගයකින් සියයට 6.9 දක්වා වැඩි වූ අතර, දර්ශකයේ මාසික වෙනස සියයට 0.6 ක් විය.

අපනයන සහ ආනයන දෙඅංශයම අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර සංචාරක ඉපැයුම්, සේවක ප්‍රේෂණ මෙන්ම ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම් වෙත පැවැති ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස වසරේ පළමු කාර්තුව තුළ ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් වාර්තා විය. තාවකාලික ඇස්තමේන්තුවලට අනුව දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් හැර) 2010 දෙසැම්බර් අවසාන වන විට වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6,610 ක සිට 2011 ජූනි 09 වන දින වන විට එ.ජ.ඩොලර් මිලියන 7,055 ක් දක්වා වර්ධනය විය. වසරේ මේ දක්වා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1.34 කින් ද, ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.88 කින් ද ජපන් යෙන්වලට එරෙහිව සියයට 0.14 කින් ද අධිප්‍රමාණය වූ අතර, යූරෝවට එරෙහිව සියයට 6.06 කින් ද ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.59 කින් ද අවප්‍රමාණය විය.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය නොකඩවාම සිදුකරගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2010 ඊට අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙම වසරේ පළමු මාස 4 තුළ දී මුළු ආදායම සියයට 18.4 කින් වර්ධනය වූ අතර, මෙම කාලසීමාව තුළ දී මුළු වියදම සහ ශුද්ධ ණයදීම් සියයට 11.6 කින් පමණක් වර්ධනය විය.

පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය අප්‍රේල් මාසයේ දී සියයට 18.4 ක් ලෙස වාර්තා වූ අතර, රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණය මෙම වර්ධනයට හේතු විය. අප්‍රේල් මාසය

තුළ දී පෞද්ගලික අංශය විසින් ලබාගත් ණය ප්‍රමාණය තවදුරටත් වර්ධනය වූ අතර, 2010 වසරේ දී වූ අඩු පාදක බලපෑම මත 2011 අප්‍රේල් මාසයේ දී එහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 31.4 ක් විය. කෙසේ වෙතත්, 2010 අගෝස්තු මාසයේ සිට පෞද්ගලික අංශය ලබාගත් ණයෙහි වැඩිවීම ආසන්න වශයෙන් මසකට රුපියල් බිලියන 33 - 35 ක් වූ අතර, 2011 අප්‍රේල් වන විට එය රුපියල් බිලියන 26 ක් දක්වා අඩු විය. මේ අතර රාජ්‍ය සංස්ථා විසින් ලබාගන්නා ලද ණය මෙම වසරේ පළමු මාස හතර තුළ දී රුපියල් බිලියන 27 කින් පමණ අඩු විය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම සහ නිෂ්පාදන බදු වැඩිකිරීම ඇතුළත්ව මෑතකාලීනව ක්‍රියාත්මක කරන ලද මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය හේතුකොට ගෙන ඉදිරි මාස වල දී සාර්ව ආර්ථික වර්ධනයන්ට අනුරූප වන ආකාරයට පුළුල් මුදල් සැපයුම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2011 ජූනි 13 වන දින පැවැති රැස්වීමේ දී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේම පවත්වා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.00 ක සහ සියයට 8.50 ක මට්ටමේ පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2011 ජූලි මස 08 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 2. වසර 3 සහ වසර 4 පරිණත කාලයකින් යුත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම

*ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය සමග තරගකාරී ලංසු තැබීම් තුළින් තීරණය වූ ආන්තික පොලී අනුපාතිකයන් සහිත එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සුදුසුකම් ලද ආයෝජකයින්ට ඉදිරිපත් කරන ලදී.*

මෙම නිකුතුව 2011 ජූනි මස 13 සිට 21 දක්වා විවෘතව තිබූ අතර 2011 ජූනි 29 වැනි දින ගෙවීම් කළ යුතු වේ. දේශීය හා විදේශීය වාණිජ බැංකුවලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 134.5 ක වටිනාකමක් සහිත ලංසු ලැබිණි. මෙම ලංසු අතරින් එක්සත් ජනපද ඩොලර් මිලියන 103.5 ක ප්‍රමාණයක් වසර 3 ක බැඳුම්කරවලින් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 23 ක ප්‍රමාණයක් වසර 4 බැඳුම්කරවලින් ද පිළිවෙළින් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ වෙළෙඳපොළ මගින් තීරණය වූ පොලී අනුපාතිකයන් වූ පාදකාංක 365 ක (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) සහ පාදකාංක 385 ක් (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) සහ පාදකාංක 375 ක් (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) යටතේ පිළිගැනීමට රජය තීරණය කරන ලදී. අද දින එක්සත් ජනපද ඩොලර් සඳහා වන හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සියයට 0.39 ක් වේ.

මෙම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව 1957 අංක 29 දරන විදේශ ණය පනතේ 2(අ) හා 2(ඇ) වගන්ති යටතේ නිකුත් කෙරිණ. නව බැඳුම්කරය නිකුත් කිරීම මගින් රැස් කරන ලද අරමුදල් කල් පිරීමට නියමිත එක්සත් ජනපද ඩොලර් මිලියන 125.8 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිදහස් කිරීම සඳහා යොදා ගනු ලැබේ.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිටපත් කර භාරදීමෙන් පසුව එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී වෙත ලියාපදිංචි කිරීමෙන් පැවරීම සිදු කළ හැකිය. සුදුසුකම් ලත් ආයෝජකයින්ට ද්විතීයික වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයින් මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිල දී ගත හැකිය.

## 3. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියමු කළමනාකරුවන් පත්කිරීම

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඉදිරියේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් පිළිබඳ කටයුතු සඳහා උපදෙස් ලබාගැනීම හා මෙහෙයවීම පිණිස බෑන්ක් ඔෆ් ඇමරිකා මෙරිල් ලින්ච්, බාක්ලේස් කැපිටල් පී.එල්සී, හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් සහ රෝයල් බෑන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ් පී.එල්.සී නමින් යුත් ආයතන හතරක් ඒකාබද්ධ නියමු කළමනාකරුවන් ලෙස පත්කරන ලදී.*

මෙම පත්කිරීම කරනු ලැබුවේ ප්‍රමුඛතම බැංකු/ආයෝජන ආයතන 7 කින් ලැබුණු අයදුම්පත් ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුවය.

## 4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චීනයේ ව්‍යවහාර මුදල් ඒකකය වන “රෙන්මින්බි” ශ්‍රී ලංකාවේ පිළිගත් විදේශ මුදල් ඒකකයක් ලෙස නම් කිරීම

*බැංකු පනතේ විධිවිධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ බැංකු මගින් සිදු කරන්නා වූ අන්තර්ජාතික ගනුදෙනුවල දී පිළිගත් මුදල් ඒකක ලැයිස්තුවට “චීන රෙන්මින්බි” මුදල් ඒකකය ද එක් කිරීමට 2011 ජුනි 27 දින මුදල් මණ්ඩලය තීරණය කොට ඇත.*

මේ අනුව, අනුමත විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවල දී, ඒ සඳහා අවසරලත් බැංකු සමග “රෙන්මින්බි” භාවිතා කිරීමට මහජනයාට අවසර ඇත. අන්තර්ජාතික ගනුදෙනුවල දී පිළිගත් අනෙකුත් මුදල් ඒකකයන් වන්නේ ඕස්ට්‍රේලියානු ඩොලර්, කැනේඩියානු ඩොලර්, ඩැනිෂ් ක්‍රෝනර්, යූරෝ, හොංකොං ඩොලර්, ජපන් යෙන්, නවසීලන්ත ඩොලර්, නෝර්වේ ක්‍රෝනර්, ස්ටර්ලින් පවුම්, සිංකප්පූරු ඩොලර්, ස්විට්සර්ලන්ත ක්‍රෝනර්, ස්විස් ෆ්‍රෑන්ක් සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලරය ය.

චීනය අන්තර්ජාතික වෙළෙඳාම, ආයෝජනය සහ විදේශ සංචිත යන අංශයන්හි ප්‍රමුඛ රටක් වන අතර, දැනට ලොව දෙවන විශාලතම ආර්ථිකය බවට පත් වී ඇත. එමෙන්ම චීනය බොහෝ රටවල් සමග පුළුල් ආර්ථික සබඳතා පවත්වාගෙන යන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස “රෙන්මින්බි” ලොව පුරා පිළිගත් මුදල් ඒකකයක් බවට පත් වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ද චීනය සමග සිදු කරන්නා වූ ගනුදෙනු සහ ආයෝජන ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ යන බැවින්, එවැනි බැංකු ගනුදෙනුවල දී චීන ව්‍යවහාර මුදල් ඒකකය භාවිතා කිරීමෙන් එම ගනුදෙනු සහ ආයෝජන කටයුතු වඩාත් පහසුවේ.

## 5. 2011 මැයි මස උද්ධමනය

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002=100) 2011 අප්‍රේල් මස පැවැති 233.4 හි සිට මැයි මාසයේ දී 234.8 දක්වා සියයට 0.6 කින් ඉහළ නැගිණි. ලක්ෂ්‍යමය උද්ධමනය අපේක්ෂා කළ පරිදි, 2011 අප්‍රේල් මාසයේ පැවති සියයට 9.8 ක ඉහළ අගයක සිට මැයි මාසයේ දී සියයට 8.8 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටිණි.*

කෙසේ වුව ද, වාර්ෂික සාමාන්‍ය පදනම මත උදධමනය පූර්ව මාසයේ පැවැති සියයට 6.6 හි සිට මැයි මාසයේ දී සියයට 6.9 දක්වා ඉහළ නැගිණි. මේ අතර, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2011 අප්‍රේල් මස පැවති සියයට 4.7 හි සිට මැයි මාසයේ දී සියයට 4.8 දක්වා සුළු වශයෙන් ඉහළ නැගුණු අතර, වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය පූර්ව මාසයේ පැවති සියයට 5.1 හි සිට මැයි මාසයේ දී සියයට 5.0 දක්වා අඛණ්ඩව පහත වැටිණි.

දර්ශකයේ සියයට 0.6ක මාසික ඉහළ යෑම කෙරෙහි ප්‍රධාන වශයෙන්ම ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 0.4) සහ නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන (සියයට 1.1) යන උප කාණ්ඩයන්ගේ මිල ඉහළ යෑම් දායක විය. ආහාර උප කාණ්ඩයෙහි; මත්ස්‍ය හා මුහුදු ආහාර, රතු ළූණු හා දෙහි වැනි කුළුබඩු සහ අර්තාපල්වල මිලගණන් ඉහළ නැගුණු අතර, බොහොමයක් එළවළු වර්ග හා පළතුරු, අමු මිරිස්, ලොකු ළූණු සහ බිත්තරවල මිල ගණන් සැපයුමෙහි සිදුවූ වර්ධනයන් හේතුවෙන් පහළ වැටිණි. රෙදිපිළි හා පාවහන් (සියයට 0.8); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.9); සෞඛ්‍ය (සියයට 0.8); ප්‍රවාහන (සියයට 0.6); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.3) යන උපකාණ්ඩයන්හි මිල ගණන් ද ඉහළ නැගිණි. මේ අතර, සන්නිවේදන, අධ්‍යාපන සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.



## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010 සහ 2011

(2006/07= 100)

| මාසය | දර්ශකය | | මාසික වෙනස්වීම % | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 | 2010 | 2011 |
| ජනවාරි | 140.4 | 149.2 | 1.9 | 1.4 | 7.1 | 6.2 | 3.2 | 6.1 |
| පෙබරවාරි | 141.1 | 151.3 | 0.5 | 1.4 | 7.5 | 7.2 | 3.3 | 6.1 |
| මාර්තු | 139.8 | 150.6 | -0.9 | -0.5 | 7.2 | 7.7 | 3.4 | 6.2 |
| අප්‍රේල් | 138.4 | 150.6 | -1.0 | 0.1 | 6.8 | 8.9 | 3.8 | 6.4 |
| මැයි | 140.1 | 151.5 | 1.2 | 0.6 | 5.6 | 8.2 | 3.9 | 6.6 |
| ජූනි | 141.2 | 151.2 | 0.8 | -0.2 | 5.1 | 7.1 | 4.3 | 6.7 |
| ජූලි | 141.2 | | 0.0 | | 4.4 | | 4.6 | |
| අගෝස්තු | 141.4 | | 0.2 | | 5.0 | | 4.9 | |
| සැප්තැම්බර් | 142.6 | | 0.8 | | 5.7 | | 5.3 | |
| ඔක්තෝබර් | 144.1 | | 1.1 | | 6.5 | | 5.7 | |
| නොවැම්බර් | 145.7 | | 1.1 | | 6.9 | | 6.1 | |
| දෙසැම්බර් | 147.2 | | 1.1 | | 6.8 | | 6.2 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව